මගේ අංකය :- JSC/SPO/EB/2020(2023)

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/ මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ / අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020**

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8.13 සහ "ඇ" පරිශිෂ්ඨයෙහි දැක්වෙන කොන්දේසි හා විෂයය නිර්දේශ අනුව අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල හා දෙමළ මාධ්‍යය වලින් කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියේ 2020.12.31 දිනට පෙර පත්වීම් ලද නිලධරයන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සේවයට බැඳී වසර 06 ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තර

| | **ප්‍රශ්න පත්‍රය** | **කාලය** | **මුළු ලකුණු** | **සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු** | **සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම** |
|---|---|---|---|---|---|
| 01 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | පැය 02 | 100 | 40 | අ.පො.ස (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |
| 02 | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය | පැය 02 | 100 | 40 | ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වීම හෝ නීතිවේදී උපාධිය හෝ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| 03 | අපරාධ හා සිවිල් නඩු කාර්ය පටිපාටිය | පැය 02 | 100 | 40 | ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වීම හෝ නීතිවේදී උපාධිය හෝ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| 04 | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 | - |

03. නිර්දේශ පත්‍රය:

**(i) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව**

මෙම ප්‍රශ්න පත්‍රය අ.පො.ස. (සා.පෙළ) ප්‍රශ්න පත්‍රයට සමාන වන අයුරින් සකස් කෙරෙනු ඇත. ඒ හා සමාන දැනුමක් මෙයින් අපේක්ෂා කෙරේ.

**(ii) ශ්‍රී ලංකාවේ නීති ක්‍රම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය**

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- අධිකරණ සංවිධාන පනත
- පුද්ගල නීති

පිළිබඳ අවබෝධය මෙයින් අපේක්ෂා කෙරේ.

**(iii) අපරාධ හා සිවිල් නඩු කාර්ය පටිපාටිය**

- අපරාධ නඩු විධාන සංග්‍රහය පනත
- සිවිල් නඩු විධාන සංග්‍රහය

පිළිබඳ අවබෝධය මෙයින් අපේක්ෂා කෙරේ.

**(iv) ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි**

**ආයතන සංග්‍රහය**

- සේවයට බඳවා ගැනීමේ කාර්යය පටිපාටි සහ පත්කිරීම් ( II වන පරිච්ඡේදය)
- මාස් පඩි, තාවකාලික තත්ත්වය, ස්ථිර තත්ත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම ( IV වන පරිච්ඡේදය)
- මුදාහැරීම, කලින් දැරූ තනතුරට පෙරලා යැවීම හා සේවය අවසන් කිරීම (Vවන පරිච්ඡේදය)
- වැටුප් ( VII වන පරිච්ඡේදය)
- අතිකාල දීමනා, නිවාඩු දින සහ නිවාඩු දින සඳහා වැටුප් සහ දීමනා (VIII වන පරිච්ඡේදය)
- ගාස්තු ( IX වන පරිච්ඡේදය)
- නිවාඩු ( XII වන පරිච්ඡේදය)
- දුම්රිය බලපත්‍ර ( XIII වන පරිච්ඡේදය)
- දිවයින ඇතුළත රාජකාරී ගමන් (XIV වන පරිච්ඡේදය)
- නිවාඩු ගමන් ( XVI වන පරිච්ඡේදය)
- රජයේ නිවාස (XIX වන පරිච්ඡේදය)
- ආරක්ෂක ඇඳුම් හා නිල ඇඳුම් ( XXI වන පරිච්ඡේදය)
- ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහය සහ ඒ පිළිබඳ කොන්දේසි ( XXIII වන පරිච්ඡේදය)
- වැටුප් ණය සහ අත්තිකාරම් (XXIV වන පරිච්ඡේදය)
- නිලධාරීන්ගේ කායික යෝග්‍යතාව පිළිබඳ වෛද්‍ය පරීක්ෂණය හා වෛද්‍ය උපචාරය (XXVI වන පරිච්ඡේදය)
- ලිපි ගණුදෙනු කිරීමේ මාර්ග ( XXVII වන පරිච්ඡේදය)
- රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල ( XXX වන පරිච්ඡේදය)
- නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග ( XXXIII වන පරිච්ඡේදය)
- සාමාන්‍ය හැසිරීම හා විනය ( XLVII වන පරිච්ඡේදය)
- විනය කාර්යය පරිපාටිය පිළිබඳ රීති ( XLVIII වන පරිච්ඡේදය)

සහ

- අධිකරණ සේවා කොමිෂන් සභාව,රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශය සහ අධිකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ

මුදල් රෙගුලාසි

- වියදම් හා ආදායම් ඇස්තමේන්තු (1 වන පරිච්ඡේදය)
- වියදම්, අතහැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාරී බලය (II වන පරිච්ඡේදය)
- මුදල් පාලනය හා ගිණුම් ගත කළ හැකිවීම (III වන පරිච්ඡේදය)
- ලැබීම් (IVවන පරිච්ඡේදය)
- ගෙවීම් (V වන පරිච්ඡේදය)
- ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම් (VI වන පරිච්ඡේදය)
- ගණන් තැබීම (VII වන පරිච්ඡේදය)
- අත්තිකාරම් ගිණුම් (VIII වන පරිච්ඡේදය)
- උසාවිවල ගිණුම් (X වන පරිච්ඡේදය)

  සහ

- රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය
  පිළිබඳ අවබෝධය මෙයින් අපේක්ෂා කෙරේ.

සටහන: සෑම ලිඛිත පිළිතුරු පත්‍රයකම අපැහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබිය හැකිය.

04. අපේක්ෂකයෙකුට තමන් සේවයට බැඳුණු භාෂා මාධ්‍යයෙන් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

05. මෙම ප්‍රශ්න පත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්න වලින් සමන්විත වනු ඇත.

06. පහත 7 වන ඡේදයේ සඳහන් කොන්දේසි වලට යටත්ව නිලධාරියෙකුට විභාගයට නියමිත සියලු විෂයයන් සඳහා එකවර හෝ එක් එක් විෂයයන් සඳහා වෙන වෙනම හෝ අවස්ථා කිහිපයක දී පෙනී සිටිය හැක. එතකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් සියයට හතලිහක් (40%) ක් නිලධාරයා විසින් ලබා ගත යුතුවේ.

07. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විසින් එකවරකදී සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු 250/- ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම්කර ඉදිරිපත් නොවූ නිලධරයන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම්කල යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. මෙම විභාග ගාස්තු **අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්** නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදු පත අයදුම් පත්‍රයේ අලවා එවිය යුතුවේ.

09. මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ සන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධරයන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග **2023 අප්‍රේල් 28** වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධරයන්ට දැන්වීමට කටයුතු කරන්න.

පී.එම්.ටී.බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්/කලේ: එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2023 මාර්තු මස 27 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

**SPECIMEN APPLICATION FORM**
**Efficiency Bar Examination for Officers in Grade III of the Court Registrars' Service of Sri Lanka - 2020**

---

01. Name:
    1:1 Name with initials Mr./Mrs./Miss: ..........................................................................................
    (In block capital letters)
    1:2 Full Name: ..........................................................................................................................
    (In block capital letters)
    1:3 Full Name: ..........................................................................................................................
    (In Sinhala/Tamil)

02. National Identity Card Number: ...........................................................................................

03. Address

    3:1 Permanent Address: ..........................................................................................................
    (In block capital letters)
    3:2 Official Address ..................................................................................................................
    (In block capital letters)

04. Contact Details
    4.1 Mobile No-: ---------------------------------------------

05. Date of Birth : Date ------- Month---------- Year-----------

06. Personal File No: EA/PF/5/-------------
    JSC/SPO/EM.PF/REG/------------

07. Date of appointment to the post of Court Registrar Grade III: ------------------------

08. Medium in which you sit for the examination :

    [ ]

    (Denote with 'S' for Sinhala and 'T' for Tamil)

09. Please give details of the subjects and the years you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I.<br>II.<br>III.<br>IV. |
| | I.<br>II.<br>III.<br>IV. |

10. Subject / Subjects you are now offering to sit for:

    (i) ..............................................
    (ii) ..............................................
    (iii) ..............................................
    (iv) ..............................................

11. (i) The value of payment made as Examination fee: ......................................................................

(ii) Name of the Bank and the Branch to which the payment was made: ...............................

(iii) Number and date of the receipt: ..............................................................................................

| |
|---|
| Affix the receipt here. |

I state that the particulars given are accurate and I am entitled to sit for the examination in the medium mentioned in the paragraph 8 above. I certify that I am appearing for the examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to be bound by the rules and regulations of the Secretary to Judicial Service Commission regarding conducting of the examination.

..............................
Date

.................................
Signature of the applicant

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss........................................................................................who is a Grade III Court Registrar personally known to me and signed before me on..........................................

....................................
Signature of the attester

Date: ......................................
Name: ....................................
Designation: ............................
Address: ..................................

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate.

02. The officer sits for this examination for the first time/ has made the correct payment as examination Fee.

03. The applicant is eligible to sit for this examination.

Designation: ...........................

Date: ...........................

.....................................
Signature of the Head of the Department